**හොරණ නගර සභාව - 2023**

**-------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

හොරණ නගර සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට හොරණ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රමිතියේ පරිච්ඡේද අංක 3.27 සිට 3.32 අතර ඡේදයන්ට අනුකූලව සමාලෝචිත වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පුස්තකාල පොත් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල ක්ෂය රු.1,468,857 ක් වුවද, රු.150,846 ක් ලෙස එනම් රු.1,318,011ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තබා ඇති බව. | ගිණුම් නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) 2020 වර්ෂයේ සිදු වී තිබුණු පිළිවෙලින් රු.779,061 ක ආදායම අඩුවෙන් සටහන්වීම, රු.217,917 ක වෙනත් විකුණුම් ආදායම වැඩියෙන් ගිණුම්ගතවීම, රු.915,975 ක අළුත්වැඩියා වියදම අඩුවෙන් දැක්වීම සහ රු.174,179 ක සේවක වැටුප් ප්‍රතිපූර්ණ ආදායම වැඩියෙන් ගිණුම්ගත කිරීම යන වැරදි නිවැරදි කිරීමේදී හර හා බැර සටහන් දෙකම සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | අවිනිශ්චිත ගිණුමක් නොතිබූ බැවින් සමුච්චිත අරමුදලට ගැලපුම් කර අවසාන ප්‍රතිඵලය ලබාගත් බව. | වැරදි නිවැරදි කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) රු.325,704 ක් හා රු.297,334 ක් හා සමුච්චිත අරමුදල බැර කිරීම පිළිවෙලින් ලෙජරයේ සමුච්චිත අරමුදල ගිණුමේ හා ණයගැති ගිණුමේ බැරට ද සමුච්චිත අරමුදල් ගිණුමේ දෙවරක් බැරට සටහන් කිරීමද සිදු කර තිබුණි. | 2024 වර්ෂයේ අවසන් ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කරන බව. | නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව කාර්යාල උපකරණ ක්ෂය වෙන් කිරීම් රු.719,071 ක් වුවද, ලෙජර් ගිණුමේ එය රු.299,668 ක් ලෙස දක්වා තිබුණි. | ලෙජර් ගිණුම නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම්ගත කළ යුතුය. |

1.6.3 **නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශයේ සංචිත හා වෙන් කිරීම් සහ ආදායමට හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන පිළිවෙලින් රු.2,191,984,753 ක් හා රු.35,682,252 ක් වුවද , ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය තුල එය පිළිවෙලින් රු.2,191,708,353 ක් හා රු.23,540,983 ක් ලෙස ලෙස එනම් රු.276,400 ක් සහ රු.12,141,269 ක් අඩුවෙන් දක්වා තිබුණි. | 2024 මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කරන බව. | වෙනස්කම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් ගිණුම් විෂයයක මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා එයට අදාළ උපලේඛනය අනුව ශේෂය අතර රු. 2,118,061 ක වෙනසක් විය. | -එම- | -එම- |

1.7 **අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | වර්ෂ 03 ඉක්මවා පැවති රු.2,287,598 ක් වූ තැන්පතු වර්ග 08 ක් නියාදනය කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කරන බව. | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනැති මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීමේ මාර්ගෝපදේශයේ 2 වැනි පරිච්ඡේදය | සභාව සතු ඉඩම් 09 ක් හා ගොඩනැගිලි 07 ක් වෘත්තීය තක්සේරුකරුවෙකු ලවා තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂයේ ද කටයුතු කර නොතිබුණි. | ඔප්පු ලබා ගත් පසු තක්සේරු කරන බව. | යොමුගත මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. **මූල්‍ය සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ වියදම රු.24,814,535 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ වියදම රු.25,910,915 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 23,440,788 | 21,296,813 | 21,880,547 | 9,457,132 | 22,768,542 | 20,183,756 | 19,505,649 | 9,832,486 |
| (ii) | කුලී | 15,417,482 | 12,575,201 | 10,775,233 | 6,396,172 | 40,464,200 | 7,615,802 | 14,041,766 | 4,184,462 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 3,404,500 | 500,000 | 523,000 | (23,000) | 3,290,500 | 481,000 | 2,571,030 | - |
| (iv) | වෙනත් ආදායම් | - | - | - | - | 15,705,750 | 349,966 | 18,678,418 | 119,278 |
| | | 42,262,770 | 34,372,014 | 33,178,780 | 15,876,304 | 82,228,992 | 28,630,524 | 54,796,863 | 14,136,226 |

2.2.2 **ආදායම් රැස්කිරීමේ කායර්සාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වරිපනම් බදු කාල විශ්ලේෂණය අනුව වර්ෂ 01 ත් 03 ත් අතර වරිපනම් බදු හිඟය රු.2,623,442 ක්ද, වර්ෂ 03 ත් 05 | ආදායම් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අය කිරීමට කටයුතු කළ යුතුය. |

ත් අතර වරිපනම් බදු හිඟය රු.2,380,388 ක්ද, වර්ෂ 05 ත් 10 ත් අතර හිඟය රු.1,132,760 ක්ද වූ අතර වර්ෂ 10 ට වැඩි හිඟය රු.489,161 ක් විය.

**(ආ) කුලී**

| | | |
|---|---|---|
| (i) සමාලෝචිත වර්ෂය ආරම්භයට තානායම් කුලී හිඟය රු.2,867,646 ක් වූ අතර වර්ෂය තුලදී ඉන් රු.2,435,396 හෙවත් සියයට 84 ක් අයකර ගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් හරහා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරන බව. | -එම- |
| (ii) තානායම් කුලී වාර්ෂික බිල් කිරීම රු.955,882 ක් වුවද වර්ෂය තුලදී ඉන් කිසිදු මුදලක් අයකර නොතිබුණි. | -එම- | -එම- |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2023 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු රු.53,663,774 ක් විය. | 2024.05.31 වන විට රු.38,821,036 ක් ලැබී ඇති අතර ඉතිරිය ඉදිරියේදී අය කරන බව. | -එම- |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යනාදිය සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 118 වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශය තුල එක් රැස් වන මල අපද්‍රව්‍ය නිසි පරිදි බැහැරලීම සඳහා සභාව විසින් ගලිරථ සේවාවක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | 2017 වර්ෂයේ සිට ගලි රථයක් ලබාදෙන ලෙස ඉල්ලීම් කළ ද මෙතෙක් සභාවට ගලි රථයක් ලැබී නොමැති බව. | යොමුගත වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.2 **අනාථපීක ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසාන වන විට සභාවේ කාර්යයන් පරිගණක ජාලගත කිරීම වෙනුවෙන් නෙක්ෆා ආයතනයට රු.4,484,470 ක් ගෙවා තිබුණද, පැකේජයට අදාල කාර්යය නිසි ලෙස ඉටු වී නොතිබුණි. | සමස්ථයක් ලෙස සලකා බලන විට පැකේජය ක්‍රියාත්මක තත්ත්වයේ පවතින බව. | මිලදී ගන්නා ලද සියළුම පැකේජයන් විධිමත්ව ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

3.3 **හඳුනාගත් පාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව අංක PB-6383 දරණ වාහනයේ එන්ජිමට හානි සිදු කිරීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණි. | මීට අදාල පත් කරන ලද කමිටු වාර්තාව 2024.05.29 සාකච්ඡා කළ අතර අවසන් වාර්තාව ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව. | යොමුගත මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

3.4 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අංක 719675 දරන ජංගම ගිණුමේ වර්ෂ 03 ක පමණ සිට පැවති රු.99,995 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | දිගු කාලීනව පවතින බැංකු ශේෂය නිරවුල් කළ යුතුය. |
| (ආ) වසර 03 ත් 05 ත් අතර කාලයක සිට පවතින ණයහිමි ශේෂ හා ණයගැති ශේෂ පිළිවෙලින් රු.2,832,498 ක් හා රු.3,444,586 ක් සමාලෝචිත වර්ෂය තුලදී ද නිරවුල් කර නොතිබුණි. | මීට අදාලව කමිටුවක් පත් කර ඇති අතර ඉදිරියේදී නිරවුල් කරන බව. | දිගුකාලීනව ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් නිරවුල් කළ යුතුය. |

3.5 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 1980 සැප්තැම්බර් 09 දිනැති අංක 105/3 දරන ගැසට් නිවේදනය මගින් හොරණ තානායමේ පාලනය නාගරික සංවර්ධන අධිකාරියට පවරා තිබුණද මාසික ගාස්තු අයවීම සම්බන්ධ විධිමත් ගිවිසුමකට එළඹී නොතිබීම නිසා 2021 වර්ෂයේ සිට හිඟ තානායම් කුලී අයකර ගැනීම සඳහා නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට සභාවට නොහැකි වී තිබුණි. | මේ සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් හරහා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරි කටයුතු කරන බව. | විධිමත් ගිවිසුමකට එළඹීමෙන් පසු ගාස්තු අයකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) හිඟ කඩ කාමර කුලී මාස 05 ක සිට වර්ෂ 04 දක්වා පැවතියද ගිවිසුම් ප්‍රකාරව හිඟ කඩ කුලී නොගෙවන්නන්ට එරෙහිව නිතීමය ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. | නොගෙවූ අය වෙනුවෙන් පවරා ගැනීමේ නිවේදන නිකුත් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් දක්වා ගිවිසුම් කාලය අවසන් වූ කඩ කාමර 29 කින් ලැබිය යුතු කඩ කාමර කුලී රු.793,000 ක් වූ අතර එම කඩ කාමර සඳහා නව ගිවිසුම් අත්සන් කිරීම හෝ ගිවිසුම් අළුත් කිරීම සිදු කර නොතිබුණි. | 2024.05.31 ට හිඟයෙන් රු.620,250 ක් අය වී ඇති අතර ගිවිසුම් අළුත් කිරීමටද කටයුතු කරමින් පවතින බව. | -එම- |

### 3.6 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පවතින ගිනි නිවීමේ රථය සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අළුත්වැඩියා කර නොතිබුණි. | රථය ලියාපදිංචිය පිළිබඳ තොරතුරු නොමැති අතර අළුත්වැඩියාවට යොමු කර ඇති බව. | ලියාපදිංචිය පිළිබඳ තොරතුරු රැස්කර රථය ධාවනයට කටයුතු කළ යුතුය. |
| (ආ) ට්‍රැක්ටර් ගලි රථය හා කම්පැක්ටර් රථය 2015 වර්ෂයේ සිට නිශ්ක්‍රීයව පැවතුණි. | ඉදිරියේදී අළුත්වැඩියාවට යොමු කරන බව. | අළුත්වැඩියා කර ධාවනයට කටයුතු කළ යුතුය. |

### 3.7 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාව සතු ට්‍රේලරයක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරියේදී තක්සේරු කර ගිණුම්ගත කරන බව. | වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) ස්ථාවර වත්කම් ලේඛන නඩත්තු කරමින් පවත්වාගෙන ගොස් තිබුණද, සමාලෝචිත වර්ෂය අවසානයේදී එම ලේඛන යාවත්කාලීන කර නොතිබූ අතර පරිගණක සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදී විධිමත් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යන බව. | ස්ථාවර වත්කම් ලේඛනය විධිමත්ව පවත්වාගත යුතුය. |
| (ඇ) සභාවේ ඉඩම් ලේඛනය තුල ඇතුලත් ඉඩම් 41 ක අයිතිය සභාව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් කැබලි 28 ක් ලැබුණු ආකාරය පිළිබඳ විස්තර නොමැති අතර ඉතිරි ඉඩම් සභාව වෙත පවරා ගැනීමට කටයුතු කරන බව. | සභාවට පවරා ගත යුතු ඉඩම් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |